# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2023.12.29 |

## ඉදිකිරීම් කටයුතු සඳහා වන ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නොවැම්බර් 2023

**ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල පහත වැටීමක් පිළිබිඹු කරමින් ඉදිකිරීම් කටයුතු සඳහා වන ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය නොවැම්බර් මාසයේදී 44.3ක අගයක් වාර්තා කරන ලදී.** නව ව්‍යාපෘති අඩු මට්ටමක පැවතීම සහ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවලට අදාළ කටයුතු අවසන් අදියරේ පැවතීම සමස්ත ක්‍රියාකාරකම් අඩු වීමට හේතු වූ බව සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී.

පෙර මාසයට සාපේක්ෂව නොවැම්බර් මාසයේදී නව ඇණවුම් පහත වැටීමක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, ඉදිරි වසරේ මුල් භාගය වන විට, විශේෂයෙන් රාජ්‍ය අංශයේ මැදිහත්වීමෙන් ක්‍රියාත්මක වීමට නියමිත නව ඉදිකිරීම් ව්‍යාපෘති කඩිනමින් ප්‍රදානය කෙරෙනු ඇතැයි සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ බොහොමයක් දෙනා අපේක්ෂා කරති. වත්මන් වාතාවරණය තුළ අවම සේවක සංඛ්‍යාවක් පවත්වාගෙන යාමට සමාගම් කටයුතු කරන බැවින් සේවා නියුක්තිය අඛණ්ඩව පහත වැටුණි. තවද, ඉදිකිරීම් කටයුතුවල පහත වැටීමත් සමඟ, තොග මිලදී ගැනීම් ප්‍රමාණය ද අඩු විය. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මෙම මාසය තුළදී ද ඉහළ අගයක පැවතුණි.

| විචල්‍යය | ඔක්. | නොවැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **සමස්ත ක්‍රියාකාරකම්** | **50.0** | **44.3** | **-** | **කඩඉම් මට්ටමේ සිට පහළ යෑමක්** |
| නව ඇණවුම් | 48.6 | 45.7 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 36.1 | 35.7 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 44.4 | 42.9 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 51.4 | 51.4 | = | සම වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි වසරේ සිට ඉදිකිරීම් කටයුතු සඳහා ඇති ඉල්ලුම ඉහළ යෑමක් සහ වසරේ මුල් මාස තුන තුළ වඩා හිතකර කාලගුණ තත්ත්වයක් අපේක්ෂා කිරීම හේතුවෙන්, ඉදිරි මාස තුන සඳහා වූ අපේක්ෂාවන් ඉහළ මට්ටමක පවතී. කෙසේ වුවද, සිදුකිරීමට නියමිත බදු සංශෝධන මගින් ඉදිකිරීම් අමුද්‍රව්‍යවල මිල ඉහළයාමේ ප්‍රවණතාවය පිළිබඳව සමාගම් අවධානයෙන් පසුවෙයි.

**සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය**

**44.3**

**2023 නොවැම්බර්**

ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය[1]

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගය පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

### විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්

සමස්ත ක්‍රියාකාරකම් : ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල සමස්ත පරිමාව. මෙය ජාත්‍යන්තර ක්‍රමවේදය අනුගමනය කරමින් "ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය" ලෙස හඳුන්වන මූලික දර්ශකය වන අතර එය කර්මාන්ත අංශයේ නිෂ්පාදන දර්ශකය සහ සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය හා සැසඳිය හැකි වේ.

සේවා නියුක්තිය: සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන.

තොග මිලදී ගැනුම්: නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගෙන ගබඩා කර තැබීම.

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය: සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය.

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.

### සමීක්ෂණ ප්‍රතිචාර

මාසික ප්‍රතිචාර 35ක් පමණ ආවරණය වන පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිව ඇති ඉහළම ශ්‍රේණිගත දේශීය ඉදිකිරීම් සමාගම් ඉලක්ක කර ගනිමින් පසුගිය මාසයට සාපේක්ෂව අදාළ මාසයේ දී ඉදිකිරීම් කටයුතු වල ප්‍රවණතා ග්‍රහණය කරගැනීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි.

[1] ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කර ඇත්තේ ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සම්පාදකයා ලෙස හඳුනාගෙන ඇති ලොව පුරා ආර්ථිකයන් 40කට අධික සංඛ්‍යාවක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සම්පාදනය කරනු ලබන එස්&පී ග්ලෝබල් (S&P Global) අනුගමනය කරනු ලබන ක්‍රමවේදය භාවිතයෙනි.